# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2114/21 – 2019 මාර්තු 13 වැනි බදාදා – 2019.03.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසයේ අඳලෙද්දුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ටීඑච්ජී/2017/511 හා 2018.04.23 දරන ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් පහත නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – මානිගෙවත්ත හෙවත් මානගෙවත්ත – **ප්‍රමාණය: හෙක්. 0.4821**

උතුරට: කහදූව පෝද්දුවගේ යසරත්න සුමනවර්ධන සහ තවත් අය හිමිකම් කියන උග්ගොඩගෙවත්ත හෙවත් උග්ගොඩගෙවත්ත හෙවත් බිම්බිරිගහහේන; නැගෙනහිරට: මාර්ගය සහ විජේසිංහ විමලා සහ තවත් අය හිමිකම් කියන තොටුපලගෙවත්ත හෙවත් තොටුපොලගාවවත්ත; දකුණට: මාර්ගය; බටහිරට: මාර්ගය සහ කහදූව පෝද්දුවගේ යසරත්න සුමනවර්ධන සහ තවත් අය හිමිකම් කියන උග්ගොඩගෙවත්ත හෙවත් උග්ගොඩගෙවත්ත හෙවත් බිම්බිරිගහහේන.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2017/වීර්/46.
2019 ජනවාරි මස 16 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 1307